**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජ්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා

වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජ්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්යය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද ආයතනය විසින් අවස්ථා 09 කදී ලබා දුන් එකතුව රු.237,400 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 34 සිට දින 75 දක්වා ප්‍රමාදවීම් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>අදාල වැඩසටහන් සැලසුම්කර අත්තිකාරම් ලබාගත් අතර කොවිඩ් 19 හේතුවෙන් සැලසුම් කල වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීමත්, සිදුකල වැඩසටහන් වල අත්තිකාරම් පියවීමට ප්‍රථමව ආයතනය වසා දැමීම (lockdown හේතුවෙන්) නිසාත් කාර්ය මණ්ඩලයේ පියවීම ප්‍රමාදවීම මත මේ තත්වය උද්ගතවී ඇත.<br>ඉදිරියේදී මෙවැනි තත්වයන් මගහරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,927,396 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.717,811 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,209,585 කට වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් රු.2,209,585 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ නොනිමි ප්‍රාග්ධන වැඩවල පර්යේෂණ උපකරණ යටතේ රු. 60,211,400 ක් පැවති අතර මෙම පර්යේෂණ උපකරණ 2020 අප්‍රේල් 05 දින වන විට ස්ථාපිත කර නිම කළ යුතුව පැවතුණි. 2020 මාර්තු 15 දින වන විට මෙම උපකරණ නියෝජ්‍යායතනය වෙත ලැබී තිබුණ අතර, යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පුහුණු කිරීම් හා යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා විශේෂඥ සේවා ලබා ගැනීමට අදාළව අවස්ථා කිහිපයකදීම ලිපි යැවීම්, මාර්ගගත (Online) ක්‍රම යටතේ පුහුණුව ලබා ගැනීමට හා ඊට අදාළ සාකච්ඡා පැවැත්වීමට කටයුතු කර තිබුණද එම පුහුණුවීම් කටයුතු නිමකර නොතිබීම හේතුවෙන් එම උපකරණ භාවිතයට ගැනීම 2021 නොවැම්බර් 16 දින වන විටත් නොහැකි වී තිබුණි. | මෙම උපකරණය ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදුවන බව තහවුරු කරගත යුතුවන අතර ඒ සඳහා උපකරණය භාවිතා කරන ආකාරය පිළිබඳව නිසි පුහුණුවක් සැපයුම්කරු විසින් ලබා දිය යුතුයි. තවද උපකරණයේ කල්පැවැත්ම, නිවැරදි දත්ත ලබා ගැනීමට එය අත්‍යවශ්‍ය වේ.<br>මෙම කරුණු දෙක තවමත් සම්පූර්ණ කිරීමට සැපයුම්කරුට නොහැකි වී ඇත. එම නිසා එහි ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම හා භාවිතයට ගැනීමට SLADA ආයතනයට තවමත් නොහැකි විය. මෙම ගැටළුවට නවතම විසඳුම ලෙස මෙම උපකරණයේ කාර්ය සාධන පරීක්ෂාවන් 2021 නොවැම්බර් 16 දින ආරම්භ කරන ලදී.<br>ක්‍රියාකාරිත්වය තහවුරු කරන තුරු උපකරණයේ වගකීම් කාලය ආරම්භ කිරීම හා උපකරණය ආයතනය තුළින් භාරගැනීම සිදුකර නොමැත. | පර්යේෂණ උපකරණ ක්‍රියාත්මක කිරීමට අවශය පුහුණු කිරීම් හා පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය විශේෂඥ සේවා ඵලදායි ලෙස අප්‍රමාදව ගැනීමට සහ ආයෝජිත මුදලට උපරිම කාර්යසාධනයක් ලැබෙන අයුරින් වත්කම් භාවිතා කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියෝජ්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 28 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූ අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 09 ක් විය. නියෝජ්‍යායතනයේ පැවති අධ්‍යාපන හා පරීක්ෂණ සහ ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමේ අංශ 02 ක පවතින අධ්‍යක්ෂ තනතුරු හා සහකාර අධ්‍යක්ෂ තනතුරු 2014 වර්ෂයේ සිට පුරප්පාඩු 04 ක් පැවතීම ආයතනයේ කාර්යසාධනයට සෘජුව බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>අධ්‍යාපන හා පරීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා පත්වීම් ලැබූ වෛද්‍ය ආයතනයේ නිලධාරිනිය ආයතනයේ පත්වීම් භාර ගැනීම සිදු නොකරන ලදී.<br>අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුරෙහි බඳවා ගැනීම් පිණිස 2014 වර්ෂයේ සිටම අවස්ථා ගණනාවකදී අයදුම්පත් කැඳවූවද ඒ සඳහා හැකියාවෙන් හා ප්‍රවීනතාවයෙන් යුතු අයෙකු බඳවා ගැනීමට අපොහොසත් වූ නිසා එහි බඳවා ගැනීමේ පරිපාටිය සංශෝදනය කිරීමට කටයුතු කළ අතර, ඉන් පසුවද ඒ සඳහා සුදුසු අයෙකු ඉදිරිපත් නොවී තිබිණි.<br>සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) හා සහකාර අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) යන තනතුරු ද්විත්වය සඳහා සහ සංවර්ධන නිලධාරී තනතුරු ද්විත්වය හා තාක්ෂණික සහකාර තනතුර 2021 වර්ෂයේදී මුලදී බඳවා ගැනීමට කටයුතු කර ඇත. ආයතනයට වාහන තුනක් පමණක් ඇති බැවින් රියදුරු මහතුන් තිදෙනෙකු පමණක් බඳවා ගන්නා ලදී. | පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තහනම් උත්තේජක පරීක්ෂණ තීව්‍ර කිරීම, වැඩි ක්‍රීඩා ප්‍රමාණයක් ආවරණය වන ලෙස තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම හා තහනම් ද්‍රව්‍ය භාවිතයේ ඇති විපාක පිලිබඳ ක්‍රීඩා ප්‍රජාවේ දැනුවත් භාවය වැඩි කිරීමේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 49 දක්වා වන බව හා සම්ප්‍රදායික දේශීය ආහාර පාන, ඖෂධ හි තහනම් සංඝටක පිළිබඳ පර්යේෂණ කිරීම හා තොරතුරු යාවත්කාලීන කර ගැනීමේ ප්‍රගතිය සියයට 75 සිට සියයට 100 දක්වා පැවතුණි. | එකඟ වෙමි.<br>කොවිඩ් 19 වසංගතය සහ අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) තනතුරු පුරප්පාඩුවී තිබූ බැවින් සැලසුම් කල උත්තේජක පරීක්ෂණ හා ප්‍රජා දැනුවත් කිරීම් සිදු කිරීමට නොහැකි විය. | තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම |